# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1435/20 – 2006 මාර්තු 10 වැනි සිකුරාදා – 2006.03.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම සහ සංශෝධනය කිරීම පිළිබඳ උපදෙස් සහ පටිපාටි

පටුන

1. හැඳින්වීම
2. අයදුම්පත්‍රයේ ආකෘතිය
3. අයදුම්කරු සහ සමාගම පිළිබඳ විස්තර
4. සමාගමේ හිමිකම් ව්‍යුහය
5. යෝජිත සේවා පිළිබඳ විස්තර
6. ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව

6. 1. අයදුම්කරුගේ තාක්ෂණික යෝග්‍යතාවය
- 6.1.1 ජාල ආකෘතිය
- 6.1.2 ජාල යටිතල පහසුකම් සහ ආවරණය
- 6.1.3 අන්තර් සම්බන්ධීය ගිවිසුම්
- 6.1.4 තාක්ෂණයන් තෝරා ගැනීම
- 6.1.4 සීමිත සම්පත් පරිහරණය කිරීම
- 6.1.6 පාරිසරික ප්‍රතිපත්ති

6.2 *අයදුම්කරුගේ මූල්‍ය තත්වය*
- 6.2.1 යෝජිත ප්‍රාග්ධනය සහ අරමුදල් සැලසුම්
- 6.2.2 යෝජිත මූල්‍ය සහ ආයෝජන සැලැස්ම

6.3 *අයදුම්කරුගේ අලෙවි සහ අලෙවිකරණ නිපුනතා*
- 6.3.1 අවස්ථා විශ්ලේෂණය
- 6.3.2 අලෙවි සහ අලෙවිකරණ සැලසුම්
- 6.3.3 වෙනත් ක්‍රියාකාරකම්

6.4 *පාරිභෝගික සේවා ශක්‍යතාවය*

6.4.1 පාරිභෝගික සේවා නියමයන් සහ කොන්දේසි

6.5 *අයදුම්කරුගේ කළමණාකරණ ශක්‍යතාවය*

6.5.1 යෝජිත කළමනාකරණ ව්‍යුහය

6.5.2 රැකියා උත්පාදනය

6.5.3 ක්‍රමෝපාය සැපයුම්

7. *ප්‍රකාශ කිරීම*
8. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම
9. අයදුම්පත්‍රය පටිපාටිය
10. බලපත්‍ර තක්සේරුකරණ ක්‍රියාවලිය
11. කරුණු ඉදිරිපත් කිරීම
12. තක්සේරුකරණ තීරණ
13. පොදු මහජනතාව වෙත දැනුම්දීම
14. අමාත්‍යවරයාට නිර්දේශ කිරීම
15. සීමිත සම්පත් පරිහණය කරන විදුලි සංදේශ සේවාවලට බලපත්‍ර ලබාදීම
16. තොරතුරුවල රහස්‍යභාවය
17. පනතේ 18 වන වගන්තිය යටතේ බලපත්‍ර සංශෝධනය කිරීම
18. වැඩිදුර විමසීම්

1. ***හැඳින්වීම*** .– 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ සහ සංශෝධිත පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් අයදුම් කිරීමට අපේක්ෂා කිරීමෙහි ලා කැමැත්තක් දක්වන පාර්ශවයන්ට ඒ පිළිබඳ උපදෙස් හා තොරතුරු සැපයීම පිණිස මෙම ලියවිල්ල පිළියෙල කරන ඇත. මෙම උපදෙස් විදුලි සංදේශ ක්‍රම පිළිබඳව බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත්‍රය (S 17 පෝර්මය) සමඟ කියවිය යුතුය.

2. ***අයදුම්පත්‍රයේ ආකෘතිය*** .– විදුලි සංදේශ පනතේ 17 වන වගන්ති ප්‍රකාරව බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේ දී අදාල තොරතුරු සඳහන් කළ අයදුම්පත්‍ර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. තොරතුරු සැපයිය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව අයදුම්කරුවන් සඳහා වන නියමයන් මෙම උපදෙස්වල අන්තර්ගත වේ.

3. ***අයදුම්කරු සහ සමාගම පිළිබඳව විස්තර*** .– අයදුම්පත්‍රයේ 1 වන සහ 2 වන කොටස් අනුව බලයලත් නියෝජිතයා (මෙහි මින් මතු අයදුම්කරු යනුවෙන් හැඳින්වේ ) විසින් තමා සහ සමාගම පිළිබඳව මූලික තොරතුරු සැපයීම අවශ්‍යවේ.

4. ***සමාගමේ හිමිකම් ව්‍යුහය*** .– අයදුම්පත්‍රයේ 3 වන කොටස අනුව සමාගමේ හිමිකම් ව්‍යුහය සහ සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී අධ්‍යක්ෂවරු සහ කොටස්කරුවන් සම්බන්ධව සෙසු තොරතුරු ප්‍රකාශ වේ. සමාගමේ සාර්ථකත්වයට හේතු වෙතැයි අනුමාන කළ හැකි කරුණු ප්‍රසාරණය කර ගැනීම පිණිස යෝජිත ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයට විදුලි සංදේශ ජාලයක් ස්ථාපනය කිරීම. කළමනාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමෙහිලා වූ සුවිශේෂී අත්දැකීම් තිබිය යුතු ය.

5. ***යෝජිත සේවාව පිළිබඳ විස්තර*** .– අයදුම්පත්‍රයේ 4 වන කොටස අනුව විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව අයදුම් කරන ලද බලපත්‍රයට අදාළවන සේවා නිශ්චය කිරීමේ අදහසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන සේවා පිළිබඳව විස්තර සැපයීම අවශ්‍යවේ.

6. ***ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව***.– අයදුම්පත්‍රයේ 5 වන කොටස අනුව අයදුම්කරු විසින් අයදුම්පත්‍රය තක්සේරු කිරීමේ කාර්ය සඳහා ව්‍යාපෘති ශක්‍යතා වර්තාවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව අයදුම් කරන බලපත්‍රය යටතේ අයදුම්කරුගේ සේවා සැපයීමේ හැකියාව තහවුරු කර ගැනීම සඳහා කොමිෂන් සභාව අයදුම් පත්‍රය තක්සේරු කරයි. අයදුම්පත්‍රය තක්සේරු කිරීමේ අදියරේ දී විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාකරවීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික මූල්‍ය අලෙවි සහ අලෙවිකරණ සහ පාරිභෝගික සේවා මෙන්ම සමාගමේ කළමණාකරණ ශක්‍යතාව හා නිපුණතා සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් බලපත්‍රය ලබා ගැනීමේ අයදුම්පත්‍රය තක්සේරු කරයි.

අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීමේ දී සමාගමේ වාර්තා සහ අයක්‍රම හා වෙනත් බැඳීම් (පිළිවෙලින් අයදුම්පත්‍රයේ 3 සහ 4 කොටසේ සඳහන්) සැලකිල්ලට ගනු ලැබේ.

6.1 *අයදුම්කරුගේ තාක්ෂණික ශක්‍යතාවය* .– අයදුම්කරු විසින් විදුලි සංදේශ ක්‍රමයක් සාර්ථකව ස්ථාපනය කිරීම, කළමනාකරණය කිරීම් මගින් පහත සඳහන් කරුණු තහවුරුකිරීමෙහිලා ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

6.1.1 *ජාල ආකෘතිය* .–අයදුම්කරු විසින් ජාලය ක්‍රියාත්මක කරන වර්ෂ 4 තුළ ප්‍රධාන ස්විචිකරණ සමූහවල පිහිටීම, පවතින වෙනත් ස්ථාන සම්ප්‍රේෂන මාර්ග කලාප පළල සමහ අන්තර් සම්බන්ධීය ස්ථාන හඳුනා ගනිමින් යෝජිත මෙහෙයුම් ජාල වාස්තු විද්‍යා සටහන ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් කරුණු ඇතුලත්ව ජාලයේ තාක්ෂණ සහ මෙහෙයුම් ආකෘතිය සම්පූර්ණයෙන්ම පැහැදිලි කරන්න.

- අ. තාක්ෂණ පිරිවිතර අදාල තාක්ෂණ ප්‍රමිති සහ ප්‍රමිති සහිත ආකෘති
- ආ. ජාලය තුළ පවතින සියළුම අන්තර් ආකෘති සඳහන් කරන්න.
- ඇ. යෝජිත සේවාවේ ශ්‍රේණිය
- ඈ. සේවා තත්ත්වවල ගුණාත්මකභාවයට අදාල තොරතුරු සහ සේවා ඉලක්ක වල ගුණාත්මකභාවය පිළිබඳ විස්තර
- ඉ. යෝජිත බිල්කරණ ක්‍රමය සහ එය මිලකරණයේ දී කෙසේ සහාය වන්නේ ද යන වග,

අයදුම්කරු විසින් එහි ජාල කළමණාකරණ තාක්ෂණික උපාය මාර්ග සහ යෝජිත විසදුම් සහ ජාල පරිහරණ කාර්යක්ෂමතාවය සේවා සැපයීම ක්‍රියාකාරීභාවය යනාදිය සඳහා සපයන ප්‍රතිලාභ සඳහන් කළ යුතුය.

6.1.2. *ජාල යටිතල පහසුකම් සහ ආවරණය*.– ජාලයේ සමස්ථ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීම සඳහා දේශීය සහ ජාත්‍යන්තර ජාලවල උපාංග සහ සමස්ථ යටිතල පහසුකම් විස්තර කරන්න. මෙම විස්තරයට ජාල කළමණාකරණ ශාක්‍යතාව, මාර්ග, සැලැස්ම සම්ප්‍රේෂණ සැලැස්ම, සංඥා සැලැස්ම සහ විවිධ වූ සැලසුම් ඇතුළත් විය යුතුය. එමෙන්ම අයදුම්කරු විසින් ජාල කාර්යය සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් ජාල කාර්යය සැලැස්ම සහ එහි උපාය මාර්ග ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු විසින් ඉලක්කගත ප්‍රතික්‍රියා සහ දෝෂ ඉවත් කිරීමේ කාල පරිච්ඡේදය ඇතුළු වැදගත් සහ ප්‍රධාන දෝෂ සම්බන්ධයෙන් ජාලයේ දෝෂ ඉවත්කිරීමේ පොදු ක්‍රියාවලිය විස්තර කළ යුතුය.

වැඩිදුරටත් අයදුම්කරු විසින් සේවා ආරම්භ කිරීම සහ ඉදිරි වර්ෂ හතරේ මෙහෙයුම් වලදී ජාල ධාරිතාවය ව්‍යාප්ත කිරීමේ සැලසුම් සහ යටිතල පහසුකම් ප්‍රවර්ධනයන් සඳහා වන වගකීම පිළිබඳව සැළසුම් කළ ජාලයේ භූගෝලීය ආවරණයේ දත්ත ලබා දිය යුතුය. එමෙන්ම අයදුම්කරු විබෙදුම් ජාල ව්‍යාප්ත කිරීමේ පිරිවැය සහ සේවා ආවරණය වර්ධනය කිරීම වැනි වෙනත් විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් සමහ යටිතල පහසුකම් හවුලේ බෙදා ගැනීමේලා යෝජිත වැඩපිළිවෙල ඉදිරිපත් කළ යුතුය.

6.1.3 *අන්තර් සම්බන්ධීය වැඩපිළිවෙල* .– අයදුම්කරු විසින් ස්විචිකරණය, සම්ප්‍රේෂණය සහ සමමහුර්තකරණය ඇතුළු අන්තර් සම්බන්ධතාවය ආශ්‍රිත වෙනත් සම්බන්ධිත ක්‍රියාකරුවන් සම්බන්ධයෙන් සපයන වක්‍ර අවශ්‍යතාවයන් පිළිබඳව තාක්ෂණ යෝජනා සැපයිය යුතු ය. එමෙන්ම එහි අන්තර්සම්බන්ධීය ආකෘතිය, අන්තර් සම්බන්ධීය ලක්ෂයයන්, අන්තර් සම්බන්ධීය අවශ්‍යතාවයන් සහ විශේෂ වැඩ පිළිවෙලවල් සඳහන් කළ යුතුය.

6.14 *තාක්ෂණය තෝරා ගැනීම*.– අයදුම්කරු විසින් තෝරාගත් තාක්ෂණය පිළිබඳ මූලික කාරණා සමහ ස්විචිකරණය සම්ප්‍රේෂන සහ මූලික භාරදීම සඳහා වන දේශීය ප්‍රවේශ පද්ධති පුළුල් පරාස සහ අගය එකතු කළ සේවා සඳහා යොදවන ලද තාක්ෂණය පිළිබඳව විස්තර සැපයිය යුතුය.

6.1.5 *සීමිත සම්පත් පරිහරණය කිරීම*.– ගුවන් විදුලි සංඛ්‍යාත අංකන සහ ජාල ව්‍යාප්ත කිරීම පිළිබඳව නීත්‍යානුකූල අධිකාරීත්වය වැනි සීමිත සම්පත් පරිහරණය කිරීම සඳහා අයදුම්කරු සැලසුම් කර ඇත්නම්, එකී අයදුම්කරු යොදාගැනීමෙහිලා සැලසුම් කරන සීමිත සම්පත් අවශ්‍යතාවයන් සමහ ජාල යටිතල පහසුකම් පිළිබඳව කෙටි විස්තරයක් (සාරාංශයක් ) සැපයිය යුතුය.

ගුවන් විදුලි සංඛ්‍යාත පරිහරණය කිරීමේ දී අයදුම්කරු විසින් ජාලයේ සංඛ්‍යාත අවශ්‍යතාවය සහ සංඛ්‍යාත පරිහරණය කිරීමේ ක්‍රමය සැපයිම යුතුය. එමෙන්ම අයදුම්කරු විසින් ඔහු එම සංඛ්‍යාත විධිමත්ව සහ කර්යක්ෂමව පරිහරණය කිරීමෙහිලා වගබලා ගන්නේ කෙසේද යන්න පිළිබඳව සඳහන් කළ යුතුය.

අංක වෙන් කිරීම සඳහා අයදුම්කරු විසින් අංක ක්‍රියාකරු ප්‍රවේශ අංක ක්‍රියාකරු තේරීමේ අංක සහ භූගෝලීය සහ භූගෝලීය නොවන හෝ වෙනත් අංක අදාළ වන්නේ ද නැද්ද යන්න සඳහන් කළ යුතුය.

6.1.6 *පාරිසරික ප්‍රතිපත්තිය* .–අයදුම්කරු විසින් පහත සඳහන් කරුණු සලකා බලමින් පාරිසරික ප්‍රතිපත්තියක් සහ සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

- අ. සාමාන්‍ය මෙහෙයුම් වලදී අපද්‍රව්‍ය නිෂ්පාදන දූෂණයන් අවමකිරීම
- ආ වෙනත් විදුලි සංදේශ පද්ධතිවලට එන ගුවන් විදුලි සංඛ්‍යාත විකිරණ සහ විද්‍යුත් චුම්බක අනුකූලතා බලපෑම් අවම කිරීම.

ඇ. අපද්‍රව්‍ය සහිත අනවශ්‍ය ද්‍රව්‍ය සඳහා වන නියමයන්

ඈ. ප්‍රතිචක්‍රීයකරණ ද්‍රව්‍ය උපරිම ලෙස භාවිතා කිරීම

ඉ. ස්වාභාවික අලංකාරණය ආරක්ෂා කිරීම

ඊ. බලය සහිත කර්යක්ෂම උපකරණ භාවිතා කිරීම

උ. ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීම උදෙසා ගන්නා වෙනත් ක්‍රියා මාර්ග

6.2 *අයදුම්කරුගේ මූල්‍ය තත්ත්වය .*– අයදුම්කරු විසින් යෝජිත විදුලි සංදේශ ක්‍රම පවත්වාගෙන යාම සඳහා එහි විස්තීරණ ප්‍රාග්ධනය අරමුදල් සහ මූල්‍ය සැලසුම් ඉදිරිපත් කළ යුතුය.

6.2.1 *යෝජිත ප්‍රාග්ධනය සහ අරමුදල් සැලසුම්.* – පළමු වර්ෂ 4 සඳහා යෝජිත ප්‍රාග්ධනය සහ අරමුදල් සැලසුම් විස්තරය එහි ඇතුළත් විය යුත්තේ.—

අ. එහි යෝජිත ප්‍රාග්ධනය පිළිබඳව පුළුල් විස්තරයක් එහි කාරක ප්‍රාග්ධන සැලැස්ම සහ අවම ණය සහ සාමාන්‍ය කොටස් ඇතුළු මූල්‍ය කරුණු පිළිබඳව විස්තරයක්

ආ. අරමුදල් ප්‍රභවයන් සහ එක් එක් ප්‍රභවයන්ගෙන් ලැබෙන වටිනාකම

ඇ. අරමුදල් සොයාගැනීමේ කාලය සහ ආයෝජනයට ගන්නා ණයකර පහසුකම්

ඈ. අසම්භාව්‍ය අරමුදලේ ප්‍රභවයන් පිළිබඳව ප්‍රතිපාදන

ඉ. ණය සහ ණයකර ආපසු ගෙවීමේ නියමයන් සහ කාලය

ඊ. අයදුම්කරු විදුලි සංදේශ ක්‍රමය සඳහා කාර්තුව පදනම් වූ ප්‍රාග්ධන සහ මෙහෙයුම් වියදම් (පුරෝකථන).

උ. ඉහත (අ) සහ (ඊ) අයිතමයන් සම්බන්ධ සමාගමේ පසුගිය ක්‍රියාකාරීත්වය (අදාලනම්)

අයදුම්කරු විසින් ව්‍යාපාර, මූල්‍ය සහ අරමුදල් සැලසුම් සහ ණයකර පහසුකම් තහවුරු කිරීම සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීමේ ලිපි ඇපකර ලිපි වැනි අදාල ලේඛණමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

6.2.2 **යෝජිත මූල්‍ය සහ අයෝජන සැලැස්ම.** – පහත සඳහන් කරුණු ඇතුළත්ව, පසුගිය වර්ෂ හතරේ මෙහෙයුම් සඳහා යෝජිත මූල්‍ය සැලැස්මේ දත්ත.

අ. ඇස්තමේන්තුගත ලාභාලාභ ගිණුම් ශේෂ පත්‍රය සහ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලකාවේ ගිණුම්කරණ රීතින්ට අනුකූලව පිළියෙල කළ යුතුය. මෙහෙයුම් වියදම්වලද වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති ග්‍රාහක ඇස්තමේන්තු වාර්ෂික වෙනස්වීම් වැනි සියළුම උපකල්පන පැහැදිලිවම විස්තර කළ යුතුය.

ආ. යොදාගත් ප්‍රාග්ධන ලැබීම්, වත්කම් ලැබීම්, මෙහෙයුම් ලාභ සීමාව, ශුද්ධ ලාභ සීමාව, ප්‍රාග්ධන ආයෝජන අනුපාතය ජංගම අනුපාතය සහ ණය සාමාන්‍ය කොටස් අනුපාතය ඇතුළත්ව ඇස්තමේන්තුගත මූල්‍ය අනුපාතයන් වේ. එක් එක් අනුපාත ගණනය කිරීමෙහිලා යොදාගත් සූත්‍රය සැපයිය යුතු ය.

ඇ. අවම වශයෙන් ආපසු ගෙවීමේ අභ්‍යන්තර අනුපාතය ශුද්ධ වර්තමාන අගය සහ ආයෝජන නැවතගෙවීමේ කාලපරිච්ඡේදය ඇතුළත්ව, අදාල මූල්‍ය මිනුම්කරණය පුරෝකථනයන් මේ හැර ශුද්ධ වර්තමාන අගය වන 10% සහ සමාන ආපසු ගෙවීමේ කාලය ගණනය කළ යුතුය. එමෙන්ම අයදුමකරු විසින් ව්‍යාපාරයට යෝග්‍ය ලාභ උපදවන පූර්ව අපේක්ෂිත කාල රාමුව සඳහන් කළ යුතුය.

ඈ. සම්බන්ධිත පිරිවැය සහ අන්තර්සම්බන්ධීය ගාස්තු ගණනය කිරීම සඳහා බැඳුනු ජාල මූලිකාංග සැපයීම පිණිස අයදුම්කරුවන් විසින් පිළිගත් පිරිවැය විගණන ක්‍රමයේ විස්තර.

ඉ. ඉහත (අ) සිට (ඈ) සම්බන්ධයෙන් සමාගමේ පසුගිය ක්‍රියාකාරීත්වය (අදාළ නම්)

6.3. *අයදුම්කරුගේ අලෙවි සහ අලෙවිකරණ නිපුණතා.*– පහත දැක්වෙන කරුණු ප්‍රකාරව අයදුම්කරු විසින් ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ වෙළෙඳ පොළ හා තරඟ කිරීමට යෙදාගන්නා කාලය සහ තරගකාරී උපාය මාර්ග ඇතුළත්ව මෙහෙයුමේ පළමු වර්ෂ 4 තුළ සැපයීමට අපේක්ෂිත සියළුම සේවා විස්තරාත්මකව සඳහන් කළ යුතුය.

6.3.1 *අවස්ථා විශ්ලේෂණය.*– අවස්ථා විශ්ලේෂණය විස්තර ඇතුළත්ව

අ. වෙළෙඳපොල ප්‍රවණතා සමාගමේ සේවාවන්ට බලපාන්නේ කෙසේද යන්න සඳහන් කරමින් ප්‍රධාන වෙළෙඳපොළ ප්‍රවණතා විශේෂලේෂණය කිරීම.

ආ. යෝජිත ව්‍යාපාරයේ තරඟකාරීත්වය

ඇ. සේවා ප්‍රධාන ඉලක්කගත වෙළෙඳපොලවල් (නිදසුන් .– තොග හෝ සිල්ලර ගෘහස්ථ හෝ ව්‍යාපාර) පාරිභෝගික වර්ගය සහ වෙළඳපොල ක්‍රමය වැනි කොටස්ගත මෙහෙයුමේ විස්තරාත්මක අලෙවි සැලැස්මක්.

ඈ. පුරෝකථන වාර්ෂික අලෙවි ක්‍රියාවලිය පිළිබඳ විස්තර

**6.3.2** *අලෙවි සහ ආලෙවිකරණ සැලසුම් .–*

අ. විශේෂ විදුලි සංදේශ සේවා සපයන විටෙකදී ප්‍රදේශයක් තුළ සේවා සඳහා ඇස්තමේන්තුගත පාරිභෝගිකයන්ගේ සංඛ්‍යාව අයදුම්කරුගේ ඇස්තමේන්තුගත වෙළඳපොල කොටස්, සේවා මට්ටම් සහ අලෙවිකරණ හා මිලකරණ උපාය මාර්ග.

ආ. සෑජු අලෙවිකරණ නිවේදන සඳහා වන එළිමහන් බෝඩ්. රූපවාහිනී සහ ගුවන්විදුලි වැනි අලෙවිකරණ මාධ්‍ය යොදා ගැනීම ඇතුලත්ව විස්තරාත්මක අලෙවිකරණ සැලැස්මක්.

ඇ. සේවා ඉල්ක්කගත කොටස් සහ භූගෝලීය ප්‍රදේශ කාණ්ඩවල අලෙවි පුරෝකථන
*නිදසුන්* .– නාගරික උපනාගරික සහ ග්‍රාමීය.

ඈ. වෙළෙඳපොල අවධානම් සහ හවුල් ආපදා පිළිබඳ සැළසුම් හඳුනා ගැනීම ( අදාළනම් )

ඉ. අනාගත සමස්ථ කාර්යය බැඳීම් සපුරාගැනීම සඳහා අයදුම්කරුගේ උපාය මාර්ග

ඊ. පර්යේෂණ සහ සංවර්ධනය ඇතුළත්ව නව සේවා සංවර්ධන සැලැස්ම.

**6.3.3** වෙනත් ක්‍රියාකාරකම් .– අයදුම්කරු විසින් පහත සඳහන් කරුණු පිළිබඳව විස්තර සැපයිය යුතු ය.

අ. අලෙවිකරණය සම්බන්ධයෙන් සාධාරණ අලෙවිකරණය සහ ආරවුල් නිරාකරණය කිරීමෙහිලා වගබලා ගැනීම පිණිස පවතින සියලුම නීති සංග්‍රහ

ආ. අයදුම්කරුවන් අතර හරස් සහනාධාර නොමැති බව තිසැක කිරීමේ වැඩපිළිවෙලවල් සහ විදුලි සංදේශ වෙළඳපලින් බාහිර සහ සමාගමේ වෙනත් වෙළඳ ක්‍රියාකාරකම්.

+ තොග සහ සිල්ලර ක්‍රියාකාරකම්
+ විදුලි සංදේශ සහ විදුලි සංදේශ නොවන ක්‍රියාකාරකම්
+ විදුලි සංදේශ උපකරණ නිෂ්පාදනය සහ සැකසීම
+ වෙනත් විදුලි සංදේශ ක්‍රියාකාරකම්

**64** *පාරිභෝගික සේවා ශක්‍යතාවය .–*

**64.1** *පාරිභෝගික සේවා නියමයන් සහ කොන්දේසි .–* අයදුම්කරු විසින් පහත සඳහන් කරුණු ඇතුලත්ව පාරිභෝගිකයා සඳහා යෝජිත සේවා සැපයීම පිළිබඳ නියමයන් සහ කොන්දේසි සැපයිය යුතුය.

අ. ගෘහස්ථ සහ ව්‍යාපාරික පාරිභෝගිකයන් සඳහා මෙම සේවා මට්ටමේ ආධාර කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව විස්තරයක් ඇතුළත්ව අපේක්ෂිත සේවා මට්ටම් සහ පාරිභෝගික ආරක්ෂාවට සහායවීම සඳහා ක්‍රම අවශ්‍ය වේ.

ආ. ගෘහස්ථ සහ ව්‍යාපාරික පාරිභෝගිකයන් දෙදෙනාම සඳහා පාරිභෝගික ගිවිසුම් පිළිබඳ විශේෂ නියමයන් සහ සියළුම වර්ගවල පාරිභෝගිකයන්ගේ වර්තමාන ගිවිසුම්වල පිටපත්.

ඇ. පාරිභෝගිකයා විසින් සේවා අස්කර ගැනීම සහ පාරිභෝගිකයා විසින් කළ පැමිණිලි සාධාරණව විසඳීමේ ක්‍රියා මාර්ග ඇතුළත්ව පාරිභෝගිකයා සම්බන්ධ සියළුම නීති සංග්‍රහයන්.

ඈ. මෙම සේවා මට්ටම් ආධාර කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව විස්තරයක් සමඟ අපේක්ෂිත සේවා මට්ටම්.

ඉ. සේවා සහ පාරිභෝගික බිල්කරණය පිළිබඳ අයක්‍රම ඇතුළත්ව සියලුම නියමයන් හා කෝනදේසි විනිවිද පෙනෙන ආකාරයෙන් ප්‍රසිද්ධ කිරීම පිණිස පිළිගත යුතු ක්‍රියාමාර්ග.

ඊ. පාරිභෝගිකයාගේ පැමිණිලි ඵලදායීව සාධාරණව විසඳීම සඳහා පිළිගත යුතු ක්‍රියා මාර්ග.

6.5 *අයදුම්කරුගේ කළමණාකරණ ශක්‍යතාවය* .– අයදුම්කරු විසින් කළමණාකරණ ව්‍යුහය, රැකියා උත්පාදනය සහ සමාගමේ ව්‍යාපාරික සහ වානිජ්‍ය ක්‍රියාකාරකම් පැහැදිලිව විස්තර කළ යුතුය.

6.5.1 *යෝජිත කළමණාකරණ ව්‍යුහය*.– අයදුම්කරු විසින් පහත සඳහන් කරුණු සැපයිය යුතු අතර ඒ පිළිබඳ විස්තර කළ යුතුය.

අ. කාර්ය මණ්ඩලය සහ පුහුණු කිරීම ඇතුළත්ව අයදුම්කරුගේ ප්‍රධාන අංශවල විස්තර ඇතුළත් සමාගමේ සංවිධාන සහ කළමණාකරණ ව්‍යුහය.

ආ. අවම වශයෙන් පසුගිය වර්ෂ 10 තුළ වෘත්තීය ඉතිහාසය සහ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සඳහන් කරමින් යෝජිත ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායමේ සාමාජිකයන් පිළිබඳ කෙටි සටහන්.

ඇ. අදාල විදුලි සංදේශ ජාල ස්ථාපනය කිරීම හා කළමණාකරණය කිරීම සම්බන්ධව ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම් සාමාජිකයන්ගේ විශේෂ පළපුරුද්ද.

6.52 *රැකියා උත්පාදනය* .– පහත සඳහන් කරුණු ඇතුළත්ව ශ්‍රී ලාංකීය ජනතාවගේ සෘජු රැකියා අවස්ථාවල තත්ත්වය සහ ප්‍රමාණය පිළිබඳව හැඳින්වීමක් කළ යුතුය.

පළමු වර්ෂ 4 කාල පරිච්ඡේදය සඳහා විදේශ රැකියා ඇතුළත්ව යෝජිත සේවකයින්ගේ සංඛ්‍යාව සහ යෝජිත රැකියා බිඳවැටීම විස්තර කර පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | | *පළමු වර්ෂය* | | *දෙවන වර්ෂය* | | *තුන්වන වර්ෂය* | | *හතරවන වර්ෂය* | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | *දේශීය* | *විදේශීය* | *දේශීය* | *විදේශීය* | *දේශීය* | *විදේශීය* | *දේශීය* | *විදේශීය* |
| තාක්ෂණික | ජ්‍යෙෂ්ඨ | | | | | | | | |
| | මධ්‍යම | | | | | | | | |
| | කණිෂ්ඨ | | | | | | | | |
| අලෙවි සහ අලෙවිකරණ | ජ්‍යෙෂ්ඨ | | | | | | | | |
| | මධ්‍යම | | | | | | | | |
| | කණිෂ්ඨ | | | | | | | | |
| මූල්‍ය | ජ්‍යෙෂ්ඨ | | | | | | | | |
| | මධ්‍යම | | | | | | | | |
| | කණිෂ්ඨ | | | | | | | | |
| නීති | ජ්‍යෙෂ්ඨ | | | | | | | | |
| | මධ්‍යම | | | | | | | | |
| | කණිෂ්ඨ | | | | | | | | |
| වෙනත් | ජ්‍යෙෂ්ඨ | | | | | | | | |
| | මධ්‍යම | | | | | | | | |
| | කණිෂ්ඨ | | | | | | | | |

(ආ) සමාගමේ මානව සම්පත් ප්‍රතිපත්ති එක් එක් කණ්ඩායම් වල වැටුප් ව්‍යුහයන් සහ පාරිභෝගිකයාගේ නියමයන් සහ කොන්දේසි

6.5.3 *ක්‍රමෝපාය සැපයුම්*.– අයදුම්කරු විසින් ජාල ගොඩනැගීම සහ එහි සාර්ථකභාවය නිසැක කිරීම සඳහා වන පශ්චාත් සේවා ආරම්භ කරන මෙහෙයුම් තුළ සියලුම යෝජිත උපාය මාර්ගික සැපයුම් විස්තර ඉදිරිපත් කළ යුතු අතර කාර්‍යභාරය විස්තර කළ යුතුය.

(අ) ව්‍යාපාරයේ නම සහ ව්‍යාපාරයේ වර්ගය පිළිබඳ කෙටි විස්තරයක්
(ආ) සමාගමේ වර්තමාන හෝ පූර්ව සම්බන්ධතා පිළිබඳ විස්තරය
(ඇ) වාණිජ්‍යමය සම්බන්ධතාව අපේක්ෂිත වර්ගය පිළිබඳ විස්තරය

අයදුම්කරු විසින් කැමැති සැපයුම්කරුවන් සහ මිලදී ගන්නා භාණ්ඩවලට අනුමැතිය දීමේ පොදු ක්‍රියාවලිය විස්තර කළයුතුය. මිළ දී ගැනීම් අනුමත කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතුය.

7. *ප්‍රකාශ කිරීම* .– අයදුම්කරු විසින් සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාවය සහ සෑම අවස්ථාවකදීම කොමිෂන් සභාව සඳහන්කරන කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කරන බව සහතික කරමින් අයදුම්පත්‍රයට අමුණා ඇති ප්‍රකාශනය අත්සන් කිරීම අවශ්‍ය කෙරේ.

8. *අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම* – අයදුම්කරු විසින් අයදුම්පත්‍රයේ සඳහන් පරිදි අවශ්‍ය තොරතුරු සහ ලිපිලේඛන සැපයිය යුතු වේ. අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේ දී අයදුම්කරු විසින් රු. 2,00,000 ක් වූ අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුවක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාව වෙත ගෙවීම අවශ්‍යවේ. අයදුම්කරුවෙකුට බලපත්‍ර ලබාදීමේ පටිපාටිය සාර්ථක හෝ අසාර්ථකවූවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව පිටපත් 03 ක් අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව සමග විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර අයදුම්පත්‍රය යනුවෙන් පැහැදිලිව ලියුම් කවරයක සඳහන් කර පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්,<br>
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,<br>
අංක 276, ඇල්විටිගල මාවත,<br>
කොළඹ 08.

ප්‍රකාශනයේ අත්සන තබන සමාගමේ බලයලත් නියෝජිතයා විසින් අයදුම්පත්‍රයේ සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ එක් එක් පිටුවෙහි සිය අත්සන තැබිය යුතුය. අයදුම්පත්‍රය සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව සමග මෘදු තැටියක් හෝ සංයුක්ත තැටියක් ඉදිරිපත් කරන්නේ නම් මැනවි. අයදුපත්‍ර ක්‍රියාවලි ගාස්තු ගෙවන තෙක් කිසිම අයදුම්පත්‍රයක් සලකා බලනු නොලැබේ.

9. *අයදුම්පත්‍ර ක්‍රියාවලිය* .–අයදුම්පත්‍ර ක්‍රියාවලියේදී කොමිෂන් සභාව අයදුම්කරු විසින් අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර ඇති බවද, පරිපාලන විස්තර ක්‍රමවත්ව සඳහන් කර තිබේදැයි යන්න නිශ්චය කරනු ලබනු ඇත. අයදුම්පත්‍රයට අමුණා ඇති අදාළ අයිතමයන් පිළිබඳ ලැයිස්තුව අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ලියකියවිලි වර්ග අවබෝධ කර ගැනීම පිණිස අයදුම්කරුට උපකාරීවේ. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ලියකියවිලි සහ ක්‍රියාවලි ගාස්තුව සමග කොමිෂන් සභාව වෙත ලැබුන විට එම බලපත්‍රය භාරගනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ලියකියවිලි සහ අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව සමග කොමිෂන් සභාව වෙත භාරදුන් විට කොමිෂන් සභාව විසින් අයදුම්පත්‍රය ලැබුණ බව දන්වනු ඇත.

අයදුම්කරු සපයා ඇති තොරතුරු අයදුම්පත්‍ර ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් නොවන බවට කොමිෂන් සභාව අදහස් කරන්නේනම්, වැඩිදුර තොරතුරු අපේක්ෂා කරන අතර, එය අයදුම්පත්‍රයේ ක්‍රියාවලිය ප්‍රමාද වීමට හේතුවේ. මෙම කරුණුවලට අනුව අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමෙන් සති 04 ක් ඇතුළත ඉල්ලා සිටින ලද තොරතුරු සපයන ලෙස අයදුම්කරුට ප්‍රකාශ කරනු ලැබේ. අයදුම්කරු කොමිෂන් සභාවේ විධිවිධාන වලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත්වීම මෙම බලපත්‍රය ලබාගැනීම සඳහා නුසුදුස්සෙකු වීමට හේතු වේ.

10. *බලපත්‍රය ලබාදීමේ තක්සේරුකරණ ක්‍රියාවලිය* .— කොමිෂන් සභාව විසින් බලපත්‍රයක් ලබාදීම පිණිස අයදුම්කරුගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේදී පිළිගත් තක්සේරුකරණ නිර්නායකයක් ආශ්‍රිතව අයදුම්පත්‍රය තක්සේරු කරනු ලැබේ. මෙම තක්සේරුකරණක්‍රියාවලිය විදුලි සංදේශ ක්‍රමයක් පවත්වාගෙන යාම පිළිබඳව තාක්ෂණ, මූල්‍ය අලෙවි සහ අලෙවිකරණ මෙන්ම කළමණාකරන ශක්‍යතා සහ අයදුම්කරුගේ නිපුණතා යනාදිය විස්තරාත්මක තක්සේරුවකින් සමන්විතවේ. තක්සේරුකරණ ක්‍රියාවලිය ආරම්භ කළ විගස කොමිෂන් සභාව අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු පරීක්ෂා කරනු ලැබේ.

තක්සේරුකරණ ක්‍රියාවලියේදී කාර්යක්ෂම ලෙස පරිහරණය කිරීම සඳහා බලපත්‍රයක් මෙන්ම බලපත්‍ර කොන්දේසි සපුරා ගැනීම, එහි ක්‍රියාවලිය අනුමත කිරීම වැනි සීමිත සම්පත් කල්පිතයක් යොදා ගැනීමෙහිලා අයදුම්කරුට ප්‍රමාණවත් සම්පත් අත්දැකීම් නිපුණත්වය සහ ප්‍රවීනත්වය ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත්විය යුතුය. පූර්වෝක්ත කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් නොවන සම්පත් තිබීම හෝ හැකියාව නොතිබීම අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් හේතුවක් වේ.

එබැවින් යෝජිත ජාලය ක්‍රියාත්මක කිරීම සහ යෝජිත සේවාව සැපයීම සඳහා අයදුම්කරුට අවශ්‍ය ශක්‍යතාවය හා නිපුණතාවය පවතින බවට පැහැදිලි සාක්ෂි සැපයීම අයදුම්කරුගේ වගකීම වේ.

11. *කරුණු ඉදිරිපත් කිරීම*.– අදාල කාරණා සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අයදුම්කරුගෙන් ඉල්ලා සිටිය හැක. මෙම කරුණු ඉදිරිපත් කිරීමේ අරමුණ වන්නේ අයදුම්කරුට යෝජිත විසඳුම්වල ඇතැම් හෝ සියළුම කරුණු සාධාරණීකරණය කිරීම සහ ප්‍රකාශ කිරීමටත් කොමිෂන් සභාව විසින් විමසන ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමටත් අවස්ථාව ලබාදීමත් ය.

12. *තක්සේරු කිරීමේ තීරණ* .– *තක්සේරුකරණ ක්‍රියාවලියේදී අයදුම්කරු විසින් ඉදිරිපත් කළ තොරතුරු* තක්සේරු කරන අතර සියයට 70 ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන ඇති අයදුම්කරුවන් විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලබයි. අයදුම්පත්‍රයේ සියළුම අවශ්‍යතාවයන් සපරන ලද දින සිට සති 6 ක් ඇතුළත කොමිෂන් සභාව බලපත්‍රයක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සිය තීරණ අයදුම්කරුට දැනුම් දෙනු ලැබේ. අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමෙහිලා බලපාන හේතු අයදුම්කරුගේ ඉල්ලීම මත දැනුම් දෙනු ලැබේ.

13. *මහජනතාව වෙත කෙරෙන නිවේදන* .–කොමිෂන් සභාව විසින් අයදුම්කරු පිළිබඳ මූලික තොරතුරු ජාතික පුවත්පත්වල ප්‍රසිද්ධ කරන අතර, එම ප්‍රසිද්ධ කළ දින සිට දින 30 ක් ඇතුළත මහජන අදහස විමසයි. විදුලි සංදේශ සේවා සැපයීම පිළිබඳ කොන්දේසි අන්තර්ගත යෝජිත බලපත්‍රයේ කෙටුම්පතක් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් ලබාගත හැකි වේ. මෙම ප්‍රසිද්ධ නිවේදනයට අනුකූලව නිසි පරිදි ඉදිරිපත් කරන ඕනෑම සැලකීරීමක් හෝ විරෝධතාවයක් කොමිෂන් සභාව විසින් සලකා බලපානු ලැබේ. අයදුම්පත්‍ර පිළිබඳව විරෝතාවයක් හෝ සැලකීරීමක් කළ විට කොමිෂන් සභාව එය සති 4 ක කාලපරිච්ඡේදයක් ඇතුළත පරීක්ෂා කර බලනු ලැබේ.

කොමිෂන් සභාවට බලපත් ප්‍රදානය නොකිරීම සඳහා හේතුවන වැදගත් කරුණු අනාවරණය වුවහොත්, විමර්ශනයේ නිගමනවලට පසුව සතියක් ඇතුළත කොමිෂන් සභාවේ තීරණ අයදුම්කරුට දැනුම්දෙනු ලැබේ.

14. අමාත්‍යවරයා සඳහා නිර්දේශ කිරීම.– මහජනතාව විසින් නගන විරෝධතා සාධාරණීකරණය කිරීම සඳහා වන විමර්ශනය තුළ කොමිෂන් සභාවට ඊට හේතුවන වැදගත් කාරණා අනාවරණය නොවුනහොත් දින 30 ක් ඇතුළත අවශ්‍ය බලපත්‍ර ගාස්තු ගෙවන ලෙසට අයදුම්කරුට උපදෙස් දෙනු ලැබේ. නියමිත කාලපරිච්ඡේදය තුළ බලපත්‍ර ගාස්තු ගෙවූ විට බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා කොමිෂන් සභාව විෂය භාර අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් මහජනතාවගේ දැනගැනීම සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීම පිළිබඳව කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවි යේ සහ ජාතික පුවත්පත්වල ප්‍රසිද්ධ කරනු ලැබේ.

බලපත්‍ර ගාස්තු දින 30 ක් ඇතුළත ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවකු වැඩිදුරටත් ඔහුගේ බලපත්‍රය ලබාගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

15. *සීමිත සම්පත් පරිහරණය කරන විදුලි සංදේශ සේවා සඳහා බලපත් ලබාදීම*.– ඉතා වැදගත් ප්‍රවේශ සඳහා ගුවන්විදුලි වර්ණාවලිය අංක සහ නීත්‍යානුකූල අධිකාරීත්ව වැනි සීමිත සම්පත් පරිහරණය කරන විදුලි සංදේශ සේවා සැපයීම පිණිස අයදුම්පත්‍ර කැඳවීමේ අවසන් දිනය කොමිෂන් සභාව විසින් කාලානුරූපීව නිල වෙබ් අඩවියේ හෝ ජාතික පුවත්පත්වල නිවේදනය කරයි. සීමිත සම්පත් වෙන් කිරීම සහ පරිහරණය කිරීම විෂය මූලිකව, සාධාරණව, විනිවිදභාවයෙන්යුතුව හා විවේචනයට තුඩු නොදෙන ආකාරයෙන් සිදු කරනු ලැබේ.

බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා මෙම ලියවිල්ලේ 12 සහ 13 වගන්තිවල අවශ්‍යතා පිළිබඳ සෑහීමකට පත්වන අයදුම්කරුවන් සඳහා වෙන්දේසියක් පවත්වනු ලැබේ. බලපත්‍ර නිකුත් කිරීමේදී වෙන්දේසියේ ඉහළ වෙන්දේසිකරුවන් සඳහා 14 වැනි වගන්තියේ සඳහන් ප්‍රතිපාදන අදාළවේ.

16. *තොරතුරුවල රහස්‍යභාවය* .–බලපත්‍ර ලබාදීමේ අවසන් අදියරේ දී රහස්‍ය සහ වෙළඳ පොල සංවේදී තොරතුරු හැර සමාගම පිළිබඳව මූලික විස්තර ප්‍රසිද්ධ කරනු ලැබේ. එවැනි රහස්‍ය තොරතුරු පැහැදිළිව සඳහන් කර වෙනත් කවරයක බහාලන ලෙස අයදුම්කරුවන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. සියළුම වෙළපොළ සංවේදී තොරතුරු ඉතා රහිසිගතව තබා ගැනීමට වගබලා ගනු ලැබේ.

17 *පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව බලපත්‍රය සංශෝධනය කිරීම* .–පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රයක ඕනෑම කොන්දේසියක් සංශෝධනය කිරීමේදී එම බලපත්‍ර කොන්දේසිය සංශෝධනය කිරීම සම්බන්ධව මහජන අදහස් කැඳවන නිවේදනයක් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ සහ ජාතික පුවත්පත්වල ප්‍රසිද්ධ කරනු ලැබේ.

පනතේ 18 වැනි වගන්තියට අනුකූලව බලපත්‍රය සංශෝධනය කිරීමේ කොන්දේසි අමාත්‍යවරයාට නිර්දේශ කිරීමට පෙර මහජනතාව වෙත කෙරෙන නිවේදනය ප්‍රකාරව ඔවුන් විසින් නිසි පරිදි ඉදිරිපත් කරන ඕනෑම සැලකිරීමක් හෝ විරෝධතාවයක් කොමිෂන් සභාව විසින් සලකා බලනු ලැබේ.

කොමිෂන් සභාව විසින් මහජන අදහස් විමසමින් යෝජිත බලපත්‍ර සංශෝධන පිළිබඳ කෙටුම්පතක් නිල වෙබ් අඩවියේ සහ ජාතික පුවත්පත්වල පළකරන අතර, එකී නිවේදනය පළ කළ දින සිට දින 30 ක් ඇතුළත අදහස් ඉදිරිපත් කළ යුතුවේ. එම නිවේදනය ප්‍රකාරව නිසි පරිදි ඉදිරිපත් කරන ඕනෑම සැලකිරීමක් හෝ විරෝධතාවයක් කොමිෂන් සභාව විසින් සලකා බලනු ලැබේ. අයදුම්පත්‍රය පිළිබඳ සැලකීරීමක් හෝ වි රෝධතාවයක් ඉදිරිපත් කර ඇත්නම් කොමිෂන් සභාව සති 04 කට නොඅඩු කාලයක් ඇතුළත එය පරීක්ෂා කරනු ලැබේ. මහජනතාව විසින් නගන ලද විරෝධතාවය සාධාරණීකරණය කිරීමේ විමර්ශනයේ දී කොමිෂන් සභාවට කිසිම වැදගත් හේතුවක් අනාවරණය නොවුවහොත්, බලපත්‍ර සංශෝධනය කිරිමට අවශ්‍ය එකඟත්වය ලබාගැනීම සඳහා අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබේ. අමාත්‍යවරයාගේ එකඟත්වය මත කොමිෂන් සභාව විසින් බලපත්‍රයේ සංශෝධන දැනුම් දෙන අතර, ඒ පිළිබඳව කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ සහ ජාතික පුවත්පත් මගින් ප්‍රසිද්ධිය ලබාදෙනු ලැබේ.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත,
කොළඹ 08.

18. *වැඩිදුර විමසීම්.*– කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබාදීමේ උපදෙස් සහ පටිපාටි අයදුම්පත්‍රය සහ තක්සේරුකරණ නිර්නායකයන් ආශ්‍රිත සියළුම තොරතුරු වෙබ්අඩවිය (www.trc.gov.lk) ඔස්සේ ප්‍රසිද්ධ කරනු ලැබේ.

මේ සම්බන්ධව සියළුම වැඩිදුර විමසීම් පහත සඳහන් ලිපිනයන්ට තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් හෝ ෆැක්ස් මගින් යොමු කළ යුතුය.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත,
කොළඹ 08.

| | | |
|---|---|---|
| දුරකථන | : | 2689345 |
| ෆැක්ස් | : | 2689341 |
| ඊමේල් | : | dgtr@sltnet.lk |
| වෙබ් අඩවිය | : | www.trc,gov.lk |

**S** 17 පෝර්මය

**විදුලි සංදේශ පද්ධති බලපත්‍රයක් ලබාගැනීමේ අයදුම්පත්‍රය**

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17 වන වගන්ති ප්‍රකාරව

*විස්තර සටහන*

* මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර, අයදුම්කරු විසින් බලපත්‍ර උපදෙස් හා පටිපාටි සහ කොමිෂන් සභාවේ අයදුම්පත්‍ර තක්සේරුකරණ නිර්නායකයන් කියවිය යුතුය.

* සියළුම අයදුම්කරුවන් විසින් (අයදුම්පත්‍රය (**S**17) සම්පූර්ණ කළ යුතුය.

* අයදුම්පත්‍රය සම්පූර්ණයෙන්ම මුද්‍රිතව සම්පූර්ණ කළ යුතුය.

* තොරතුරු විධිමත් ආකාරයෙන් පැහැදිළිව ඉදිරිපත් කරන්න.
යෝජිත විදුලි සංදේශ ක්‍රමය සඳහා ඉල්ලා සිටින තොරතුරු අදාළ නොවේනම් කරුණාකර අදාළ නැත යන්න සඳහන් කරන්න.

* ඉල්ලා සිටින තොරතුරු සැපයීම සඳහා ලබාදී ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවන්නේනම් අයදුකරු විසින් අතිරේක පිටු ඇමිණිය යුතුය. අතිරේක පිටුවල තොරතුරු පැහැදිළිව ඉදිරිපත් කළ යුතු අතර, මෙම පෝර්මය ප්‍රකාරව අංකනය කළ යුතුය. අමුණන සියළුම පිටු **A**4 ප්‍රමාණයේ කඩදාසිවල මුද්‍රණය කළ යුතුය.

* අයදුම්පත්‍රයේ සිදුකරන ඕනෑම නිවරදි කිරීමකදී හෝ පරිවර්තනයකදී අයදුම්කරු දිනය සහිතව අත්සන් කළ යුතුය.

* අයදුම්කරු විසින් අයදුම්පත්‍රයේ අදාළ ඇමුණුම් සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ පිටපත් 3 ක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත,
කොළඹ 08.

| | | |
|---|---|---|
| දුරකථන | : | 2689345 |
| ෆැක්ස් | : | 2689341 |
| ඊමේල් | : | dgtr@sltnet.lk |
| වෙබ් අඩවිය | : | www.trc., gov.lk |

*1 වන කොටස*

1. *බලයලත් නියෝජිතයා (අයදුම්කරු) සම්බන්ධ විස්තර :*

බලයලත් නියෝජිතයා (අයදුම්කරු) විසින් තමා පිළිබඳ පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය. (ජාතික හැඳුනුම්පත්‍රයේ පිටපතක්/විදේශ ගමන් බලපත්‍රයේ අදාළ පිටු ඇමිණිය යුතුය.

1.1 සම්පූර්ණ නම :————.

1.2 උපන් දිනය :————.

1.3 ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ අංකය :————.

1.4 පුරවැසිභාවය :————.

1.5 ලිපිනය :————.

1.6 දුරකථන අංකය :————.

1.7 ෆැක්ස් අංකය :————.

1.8 ඊමේල් ලිපිනය :————.

*2 වන කොටස*

*2. සමාගම සම්බන්ධ විස්තර* :

අයදුම්කරු විසින් ව්‍යාපාරය නීතිගත කිරීමේ සහතිකය හා කොන්දේසි සහ සමාගමේ ගිවිසුම්වල සහතික කළ පිටපත් මගින් තහවුරු කරන පරිදි ඔහුගේ සමාගම පිළිබඳ පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය.

2.1 සමාගම ලියාපදිංචි කිරීමේ නම :————.

2.2 ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ලිපිනය :————.

2.3 නීතිගත කිරීමේ දිනය :————.

2.4 ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ලිපිනය :————.

2.5 දුරකථන අංකය :————.

2.6 ෆැක්ස් අංකය :————.

2.7 ඊමේල් ලිපිනය :————.

2.8 ව්‍යාපාරික ගිණුමක් පවත්වාගෙන යන විටකදී බැංකුවේ නම සහ ඒ සම්බන්ධ විස්තර :—

*3 වන කොටස*

3. *සමාගමේ හිමිකම් ව්‍යුහය :*

අයදුම්කරු විසින් අදාළ ලියකියවිලි සාක්ෂි මගින් තහවුරු කරන පරිදි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි, අධ්‍යක්ෂවරුන් සහ සමාගමේ සියයට 5 කට වැඩි කොටස් ප්‍රමාණයක් පවතින කොටස්කරුවන් පිළිබඳ පහත සඳහන් තොරතුරු සැපයිය යුතුවේ. (ජාතික හැඳුනුම්පත්/විදේශ ගුවන් බලපත්‍රවල අදාළ පිටුවල පිටපත් සහ වෙනත් අදාළ ලියකියවිලි ඇමිණිය යුතුය.)ඩ

3.1 *ප්‍රධාන විධයක නිලධාරියා සහ අධ්‍යක්ෂවරු.*

අයදුම්කරු විසින් ප්‍රධාන විධායක නිලධාරියා සහ එක් එක් අධ්‍යක්ෂවරයා පිළිබඳ පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය.

(අ) සම්පූර්ණ නම :—————.
(ආ) උපන් දිනය :—————.
(ඇ) ජාතිය :—————.
(ඈ) ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත් අංකය :—————.
(ඉ) පුරවැසිභාවය :—————.
(ඊ) පෞද්ගලික ලිපිනය :—————.
(උ) රැකියාව :—————.
(ඌ) පත්වීමේ දිනය :—————..
(එ) පසුගිය වර්ෂ 5ක කලපරිච්ඡේදය තුළ පැවති අධ්‍යක්ෂකත්වයන් :—————.
(ඒ) වෙනත් ව්‍යාපාරික කොටස් :—————.
(ඕ) අයදුම්කරන විදුලි සංදේශ ක්‍රමය සහ සේවා පවත්වාගෙන යාමට අදාළ අත්දැකීම් සහ පසුබිම පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න :—————.

*3.2 කොටස්කරුවන්*

අයදුම්කරු විසින් සමාගමේ කොටස් ප්‍රාග්ධනය (කොටස් වර්ගය, එක් එක් කොටස් සංඛ්‍යාව සහ වටිනාකම) පිළිබඳ විස්තර සහ සියයට 5ක වැඩි කොටස් නිකුතුවක් සහිත එක් එක් කොස්කරුවන් පිළිබඳ පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය. (කොටස් සහතිකවල සහ වෙනත් අදාළ ලියකියවිලිවල පිටපත් ඇමිණිය යුතුය) කොළඹ තොග විනිමය හුවමාරුවේ ලැයිස්තුගත සමාගමක් නම්, එම කොටස් වර්ගය පිළිබඳ විස්තර සපයන්න.

හවුල්කරුවකු නම් හවුල්කාරිත්වය පිළිබඳ විස්තර සපයන්න. (අදාළ නම්)

(අ) සම්පූර්ණ නම :—————.
(ආ) උපන් දිනය :—————..
(ඇ) ජාතිය :—————.
(ඈ) ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත් අංකය :—————.
(ඉ) පුරවැසිභාවය :—————.
(ඊ) පෞද්ගලික ලිපිනය :—————.
(උ) කොටස්වල ප්‍රතිශතය :—————.
(ඌ) කොටස් නිකුත් කළ දිනය :—————.

***3.3 විශේෂිත පුද්ගලයන්ගේ පාලනය*** :

අයදුම්කරු විසින් විශේෂිත පුද්ගලයන් (ප්‍රධාන විධායක නිලධාරි එක් එක් අධ්‍යක්ෂවරයා සියයට 5කට වැඩි කොටසක් සහිත එක් එක් කොටස්කරුවන්) පිළිබඳ පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය.

(අ) බංකොලොත් වූ හෝ බංකොලොත්වීමට යන සමාගමක සමාගමේ විශේෂිත පුද්ගලයන් සිටී ද, නැද්ද යන වග (සිටීනම් නම සහ විස්තරය සපයන්න) :—

(ආ) බලපත්‍ර කොන්දේසිය උල්ලංඝනය කිරීම නිසා කිසියම් රටක නියාමන අධිකාරිය රජය/අමාත්‍යාංශය විසින් බලපත්‍රය අවලංගු කල සමාගමක සමාගමේ විශේෂිත පුද්ගලයන් සිටී ද, නැද්ද යන වග (සිටී නම් සහ විස්තරය සපයන්න) :—

(ඈ) විශේෂිත පුද්ගලයන් විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හෝ සැපයීම සඳහා වන බලපත්‍රලාභී යම් වෙනත් ව්‍යාපාරයක ප්‍රතිලාභී (කොටස්කරුවෙක්ද නැද්ද යන වග කොටස්කරුවෙකු නම් නම සහ විස්තර සපයන්න.)

(ඇ) සමාගමේ විශේෂිත පුද්ගලයන්, කිසියම් විටෙක හෝ දැන් වංකභාවය, වංචාව, සොරකම් කිරීම හෝ සැහැසිකමක නිරතවීම හේතුවෙන් කිසියම් විභාග පටිපාටියකදී උසාවියකදී, අධිකරණයකදී විත්තිකරු හෝ වගඋත්තරකරු වී සිටී ද නැද්ද යන වග (සිටී නම්, නම් හා විස්තර සපයන්න.)

*3. 4 සමාගමේ වාර්තාව*

අයදුම්කරු විසින් .—

(අ) සමාගමේ කළමනාකරණ ව්‍යුහයේ දළ ආදර්ශයක් සහ විස්තරාත්මක කෙටි සටහනක් සැපයිය යුතු වේ. අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සහ පසුගිය වර්ෂ 10 තුළ වෘත්තීය ඉතිහාසය සඳහන් කරමින් අධ්‍යක්ෂවරු පිළිබඳ කෙටි සටහනක් ඇතුළත් කළ යුතුවේ. විදුලි සංදේශ ජාලයක් ස්ථාපනය කිරීම සහ කළමනාකරණය කිරීමට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ යම් වෙනත් විශේෂ අත්දැකීම් පිළිබඳ විස්තර සැපයිය යුතුවේ.

(ආ) අයදුම්කරු විසින් බාහිර ආයතන සහ උපදේශකයන් යනාදීන්ගේ සේවය ලබා ගන්නේ නම් එම සංඛ්‍යාව ඇතුළත්ව සියලුම ක්‍රියාකාරකම් ලැයිස්තුගත කරන්න.

(ඇ) සමාගමේ පහත සඳහන් වෘත්තීය උපදේශකයන්ගේ නම්, ලිපිනයන් හා වෙනත් අදාළ විස්තර සැපයිය යුතුවේ.

i. තාක්ෂණ ii. නීති iii. මූල්‍ය iv. විගණන

(ඈ) සමාගම හෝ එහි දැනට පවතින හෝ පැවති අනුබද්ධ ආයතනයක් විසින් ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක විදුලි සංදේශ බලපත්‍රයක් ලබාගෙන තිබේද නැද්ද යන වග සඳහන් කළ යුතුවේ.

(ඉ) සමාගම හෝ කිසියම් සාමාජික ශාඛාවක් විසින් විදුලි සංදේශ බලපත්‍රයක් සඳහා ඉදිරිපත් කළ අයදුම් පත්‍රයක් ශ්‍රී ලංකාව හෝ වෙනත් රටක් විසින් ප්‍රතික්ෂේපකර ඇති, නැති යන වග සඳහන් කළ යුතු වේ.

(ඊ) සමාගම හෝ කිසියම් සාමාජික ශාඛාවක් විසින් ලබාගත් විදුලි සංදේශ පද්ධති බලපත්‍රයක් ශ්‍රී ලංකාව හෝ වෙනත් රටක් විසින් අවලංගු කර ඇති, නැති වග සඳහන් කරන්න.

*4 වන කොටස*

4 *යෝජිත සේවා පිළිබඳ විස්තර*.– අයදුම්කරු විසින් සැපයීමට අපේක්ෂා කරන සේවා පිළිබඳව ප්‍රමාණවත් විස්තර සැපයිය යුතු අතර, එමගින් කොමිෂන් සභාවට අයදුම් කරන බලපත්‍රයට අදාළ සේවා නිසැක කිරීමට වගබලා ගැනීමට හැකිවය යුතු වේ. පහත සඳහන් විස්තර ඇතුළත් කළ යුතු වේ.

(අ) එක් එක් යෝජිත සේවාව සහ අදාළ අයක්‍රම පිළිබඳ විස්තරයන් ;

(ආ) අදාළ සේවාව දීප ව්‍යාප්ත හෝ ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත වී ඇති නැති වග පිළිබඳ භූගෝලීය ආවරණය ;

(ඇ) සැපයිය යුතු සහ ඉලක්කගත පාරිභෝගික පදනමකට අපේක්ෂිත පාරිභෝගිකයන්ගේ වර්ගීකරණය ;

(ඈ) මෙහෙයුම් ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය ක්‍රියාත්මක වැඩසටහන සහ වර්ධන සැලැස්ම ;

(ඉ) විශ්වීය සේවා බැඳීම් සැපයීම සඳහා පිළිගත යුතු මිනුම්දඬු ;

(ඊ) මහජනතාවට ලබාදෙන දුරකථන නාමාවලි තොරතුරු සේවක පිළිබඳ විස්තර ; (අදාළ වූ විටෙකදී)

(උ) අයදුම්කරු විසින් සැපයීමට අදහස් කරන හදිසි සේවා පිළබඳ විස්තර

*5 වන කොටස*

*5. ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව*

(ඔබගේ අයදුම්පත්‍රය සමග ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් කරන බලපත්‍රය සඳහා විදුලි සංදේශ ක්‍රම ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම පිණිස ඊට අයදුම්කරුවන්ගේ සමාගමේ තාක්ෂණික මූල්‍ය, අලෙවි සහ අලෙවිකරණ, පාරිභෝගික සේවා සහ කලමණාකරන ශක්‍යතාවයන් හා නිපුණතා ඇතුළත් කළ යුතුවේ. මෙම පරාමිතීන් පිළිබඳව බලපත්‍ර ලබාදීමේ පටිපාටි සහ උපදෙස්වල 6 වැනි වගන්තියේ විස්තරාත්මක පැහැදිලි කර ඇත. අයදුම්පත්‍රය නිශ්චය කරන විට ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ සපයන තොරතුරු සැලකිල්ලට ගනු ඇත.)

*6 වන කොටස*

*ප්‍රකාශ කිරීම .—*

මම.....................................මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති සියළුම තොරතුරු සත්‍ය බව මෙයින් සහතික කරන අතර, මෙම ප්‍රදානය කළ බලපත්‍රයේ කොන්දේසි හා නියමයන් පිළිපැදීමට පොරොන්දු වෙමි. තවද අසත්‍ය තොරතුරු පදනම් කරගෙන ප්‍රදානය කළ බලපත්‍රයක් මගින් විදුලි සංදේශ ක්‍රමයක් ස්ථාපනය කර ඇත්නම් එය එකී බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හේතුවන බවද දනිමි.

____________________,
සමාගමේ බලයලත් නියෝජිතයාගේ අත්සන

දිනය :—————.

අයදුම්පත්‍ර සඳහා පරීක්ෂා සටහන

අ. *අයදුම්කරුගේ අවශ්‍යතාවයන්* :

1. අයදුම්පත්‍ර ක්‍රියාවලි ගාස්තුව වන රු. 2,00,000 මීට ඇතුළත්ද ? **ඔව්/නැත**
2. අදාළ පරිදි අයදුම්පත්‍රයේ 1,2,3 සහ 4 කොටස් සම්පූර්ණ කර තිබේද ? **ඔව්/නැත**
3. අයදුම්පත්‍රයේ 5 වන කොටසේ සඳහන් කර ඇති පරිදි ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කර තිබේද ? **ඔව්/නැත**
4. 6 වන කොටසේ සඳහන් ප්‍රකාශ කිරීමේ සමාගමේ බලයලත් නියෝජිතයා විසින් අත්සන් කර තිබේද ? **ඔව්/නැත**
5. ඇමුණුම් සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඇතුළත්ව අයදුම්පත පිටපත් 3 කින් යුක්තව ඉදිරිපත් කර තිබේද ? **ඔව්/නැත**

ආ . *ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන* :

1. ජාතික හැඳුනුම්පතේ/සමාගමේ බලයලත් නියෝජිතයාගේ විදේශ ගමන් බලපත්‍රයේ අදාළ පිටුවල පිටපතක්, **ඇත/නැත**
2. බලයලත් ගමේ නියෝජිතයාගේ පත්වීම ස්ථිර කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය නිකුත් කළ ලිපියක්, **ඇත/නැත**
3. සමාගමේ ව්‍යාපාරය නීතිගත කිරීමේ සහතිකය සහතික කළ පිටපතක්, **ඇත/නැත**
4. සමාගමේ හවුල් ගිවිසුම සහ කොන්දේසි සහතික කළ පිටපතක්, **ඇත/නැත**
5. ප්‍රධාන විධයක නිලධාරියාගේ අධ්‍යක්ෂවරුන්ගේ සහ 5%ක කට වැඩි කොටස් ප්‍රමාණයක් හිමි කොටස්කරුවන්ගේ ජාතික හැඳුනම්පතේ/ විදේශ ගමන් බලපත්‍රයේ අදාළ පිටුවල පිටපත් සහ ඔවුන්ගේ පාලනය පිළිබඳ වෙනත් අදාළ ලියකියවියවිලි, **ඇත/නැත**
6. කොටස් සහතිකයේ සහ වෙනත් අදාළ ලියකියවිලි **ඇත/නැත**

අයදුම්පත්‍රය තක්සේරු කිරීමේ නිර්නායක

අයදුම්පත්‍රය තක්සේරු කිරීම පිණිස අයදුම්කරු විසින් සපයා ඇති තොරතුරු පදනම් කරගන්නා අතර සමාන බර තැබීම් (ලකුණු) සහිතව පහත සඳහන් නිර්නායකයන් සළකුණු කරනු ලැබේ.

| අංකය | තක්සේරුකරන නිර්නායන | ලකුණු |
|---|---|---|
| 1 | තාක්ෂණය | 30 |
| | ජාල ආකෘතිය<br>ජාල ආවරණ සැලැස්ම හා කාර්යය.<br>ප්‍රධන ජාල සැලැස්ම හා අන්තර්සම්ධතාවය<br>සීමිත සම්පත් ඵලදායි ලෙස පරිහරණය කිරීම<br>වෙනත් ක්‍රියාකාරකම් සමග යටිතල පහසුකම්<br>බෙදා ගැනීම, පාරිසරික සළකා බැලීම | |
| 2 | මුල්‍ය | 20 |
| | ප්‍රාග්ධන සහ අරමුදල් විශ්ලේෂණය<br>මුල්‍ය සහ ආයෝජන විශ්ලේෂණය | |
| 3 | අලෙවි සහ අලෙවිකරණ | 10 |
| | අලෙවි ප්‍රවණතා විශ්ලේෂණය<br>අලෙවි සැලැස්ම<br>අලෙවි සංවර්ධනය සහ අලෙවිකරන උපාය මාර්ග<br>අලෙවිකරණය පිළිබඳ නීති සංග්‍රහ | |
| 4 | පාරිභෝගික සේවා | 10 |
| | පාරිභෝගික ආරක්ෂණ සහ අපේක්ෂිත සේවා මට්ටම්<br>පාරිභෝගික ගිවිසුම්<br>බිල්කරණය පාරිභෝගික විමසීම් සහ පැමිණිලි සම්බන්ධ<br>නීති සංග්‍රහ | |
| 5 | කළමනාකරණය | 10 |
| | යෝජිත කළමනාකරණය ව්‍යුහය<br>රැකියා උත්පාදනය<br>කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ මානව සම්පත්<br>කළමණාකරණය | |
| 6 | සමාගමේ ව්‍යුහය | 10 |
| | නීතිගත කිරීම<br>ප්‍රධාන විධායක නිලධාරි අධ්‍යක්ෂවරු සහ කොටස්කරුවන්<br>සමාගමේ දේශිය හිමිකම්<br>බැංකුකරුවන්ගේ ඇප | |
| 7 | අයකුම සහ වෙනත් බැඳීම් | 10 |
| | යෝජිත අයක්‍රම ව්‍යුහය<br>විශ්වීය සේවා වගකීම්<br>හදිසි සේවා සැපයීම | |

03-558

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.